# ජාතික ලුණු සමාගම

## මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ජාතික ලුණු සමාගම, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ විෂය පථය යටතේ වන රජය සතු සමාගමකි. අලිමංකඩ ලුණු ලේවායේ (කිලිනොච්චිය) සේවය කිරීමට පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

### නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (HM1-1)

**ස්ථිර පදනම මත**

**(අලිමංකඩ ලුණු ලේවාය - තනතුරු 01)**

**අවශ්‍ය සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විද්‍යා/ ඉංජිනේරු විද්‍යා/ කළමනාකරණය/ වාණිජ්‍යය පිළිබඳ ප්‍රථම උපාධියක්

**සමග**

ව්‍යාපාර පරිපාලනය/ විද්‍යා/ ආර්ථිකවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකම් හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක, තනතුරෙහි විෂය අවකාශයට අදාළ ආශ්‍රිත සාමාජිකත්වය.

**සහ**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික / රාජ්‍ය නොවන ආයතනයක අවම වශයෙන් වසර 12 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද

**හෝ**

02. පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පූර්ණ සාමාජිකත්වය

**සහ**

සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක / රාජ්‍ය නොවන ආයතනයක අවම වශයෙන් වසර දොළහක (12) පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**හෝ**

2. තනතුරට අදාළ විෂය අවකාශයේ කළමනාකාර ප්‍රභේදයේ තනතුරක (MM) 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (5) සතුටුදායක සේවාවක් සම්පූර්ණ කර තිබීම

**වැටුප් පරිමාණය :** HM 1-1- 2016 (ප්‍රාරම්භ වැටුප රු. 80,295/- වැටුප් වර්ධක - 15 X 2,270 - 114,345) හා ජීවන වියදම් දීමනාව රු. 17, 800/-, මාසික දීමනාව රු. 5,000/-, සමාගමේ වාහනය හෝ වාහන දීමනාව රු.50,000/-, වෘත්තීය දීමනාව රු. 3,000/-, දුරකථන දීමනාව රු. 3,750/- වැනි අනෙකුත් රජයේ අනුමත දීමනා සහ රජයේ අනුමත ඉන්ධන දීමනාව ලබා දෙනු ලැබේ.

**වයස :** අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතුය. (ඉහළ වයස් සීමාව රාජ්‍ය අංශයේ / සංස්ථා සහ අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.)

**තෝරා ගන්නා ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### කළමනාකරු (අලෙවිකරණ) - (MM 1-1)

**ස්ථිර පදම මත**

**(අලිමංකඩ ලේවාය - තනතුරු 01)**

**අවශ්‍ය සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අලෙවිකරණ කළමනාකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උපාධියක් සහ පළමු උපාධිය ලබාගැනීමෙන් පසු රජයේ හෝ පිළිගත් ආයතනයක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**හෝ**

02. CIM, SLIM විභාගය අන්තර්මධ්‍ය මට්ටමින් සමත්වීම සමග ඕනෑම රජයේ හෝ පිළිගත් ආයතනයක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අඩුතරමින් වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

01. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**හෝ**

02. තනතුරට අදාළ විෂය අවකාශය තුළ කනිෂ්ඨ කළමනාකාර (JM) ප්‍රභේදයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

**වැටුප් පරිමාණය :** MM 1-1-2016- (ප්‍රාරම්භ වැටුප රු. 53,175/-, වැටුප් වර්ධක - 10 X 1,375 - 15 X 1,910 -95,575) හා ජීවන වියදම දීමනාව රු. 17,800/-, විශේෂ දීමනාව රු. 5,000/-, වෘත්තීය දීමනාව රු. 3,000/- දුරකථන දීමනාව රු. 2,000/- සහ රජයේ අනුමත අනෙකුත් දීමනාද ලබා දෙනු ඇත.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ වේ.

**තෝරාගන්නා ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### යන්ත්‍රාගාර කළමනාකරු (කොන්ත්‍රාත් පදනම මත වසර එකක කාලයක් සඳහා)

**(අලිමංකඩ ලුණු ලේවාය - තනතුරු 01)**

නිදහස් ප්‍රවාහ ලුණු කුඩු සැකසුම් යන්ත්‍රාගාර කළමනාකරු ලෙස ඔහු/ඇය, නිෂ්පාදක ඉලක්ක සපුරාලන බව සහතික කරලමින් යන්ත්‍රාගාරයේ සමස්ත මෙහෙයුම් සහ ආරක්ෂිත හා කර්යක්ෂම ක්‍රියාකාරී පරිසරයක් සහතික කිරීමට කාර්යමණ්ඩල කළමනාකරණය කිරීම සඳහා වග වනු ඇත.

**අවශ්‍ය සුදුසුකම්**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් භෞතික/ ශාරීරික විද්‍යාව හෝ ඉංජිනේරු ශිල්පය (යාන්ත්‍රික) පිළිබඳ උපාධියක් සහ පළමු උපාධිය ලබාගැනීමෙන් පසු රජයේ හෝ පිළිගත් ආයතනයක, කාර්මික ආයතනයක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (1) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

02. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ අදාළ ක්ෂේත්‍රයක යාන්ත්‍රික / මෝටර් රථ / පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් 7 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ කාර්මික ආයතනයක හෝ තනතුරට අදාළ ව්‍යාපෘතියක අවම වශයෙන් වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**වැටුප් පාරිතෝෂික**

මූලික වැටුප : රු. 53,175 සහ අනෙකුත් රජයේ අනුමත දීමනා (ජීවන වියදම් දීමනාව රු. 17,800/-, මාසික දීමනාව රු. 5,000/-, දුරකථන දීමනාව රු. 2,000/- සහ වෘත්තීය දීමනාව රු. 3,000/-)

**වයස් සීමාව**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීමේ ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### යන්ත්‍රාගාර ක්‍රියාකරු - කොන්ත්‍රාත් පදනම මත

**වසර 1 ක කාලයක් සඳහා**

**(අලිමංකඩ ලුණු ලේවාය - තනතුරු 01 යි)**

**රැකියා පැතිකඩ**

නිදහස් ප්‍රවාහ ලුණු කුඩු සැකසුම් යන්ත්‍රාගාර ක්‍රියාකරුවකු ලෙස ඔහු/ ඇය ඵලදායී නිෂ්පාදනය හා උසස් තත්ත්වයේ නිෂ්පාදන ප්‍රමාණයන් සහතික කර ලීමට යන්ත්‍රාගාරයේ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ක්‍රියාකරවීමේ හා නඩත්තු කිරීම සඳහා වග වනු ඇත.

**අවශ්‍ය සුදුසුකම් :**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ අදාළ ක්ෂේත්‍රයක යාන්ත්‍රික/ මෝටර් රථ පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමට නොඅඩු අදාළ විෂයයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග රජයේ හෝ පිළිගත් පුද්ගලික/ සමුපකාර අංශයේ කර්මාන්ත හා සම්බන්ධ ආයතනයක අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද

**වැටුප් පාරිතෝෂික**

මූලික වැටුප - (රු. 30,310/- සහ රජයේ අනුමත දීමනා, ජීවන වියදම් දීමනාව රු.17,800/-, මාසික දීමනාව රු. 5,000/-)

**වයස් සීමාව**

වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරාගැනීමේ ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි

### ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික ශිල්පී - කොන්ත්‍රාත් පදනම මත

**(අලිමංකඩ ලුණු ලේවාය - තනතුරු 01)**

**රැකියා සාරාංශය**

අපගේ නිෂ්පාදන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ පාලනය කිරීමට ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික ශිල්පී ප්‍රවීණයකු විය යුතුය. ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික ශිල්පී, නිෂ්පාදන ඉලක්ක සපුරාගැනීමට නිෂ්පාදන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ආරක්ෂිතව හා කාර්යක්ෂමව මෙහෙයවීම සහතික කරලමින් තාක්ෂණ ශිල්පියෙකු ලෙසද රාජකාරී ඉටුකරනු ඇත.

**අවශ්‍ය සුදුසුකම් :**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ අදාළ ක්ෂේත්‍රයක යාන්ත්‍රික/ මෝටර් රථ පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සමග රජයේ හෝ පිළිගත් පෞද්ගලික/ සමුපකාර අංශයේ කර්මාන්ත හා සම්බන්ධ ආයතනයක අවම වශයෙන් වසර දෙකක පළපුරුද්ද

**වැටුප් පාරිතෝෂික :**

මූලික වැටුප - (රු. 30,310/-) සහ රජයේ අනුමත වෙනත් දීමනා (ජීවන වියදම් දීමනාව රු. 17,800/- මාසික දීමනාව රු. 5,000/-)

**වයස් සීමාව**

වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**තෝරාගන්නා ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### සහකාර යන්ත්‍රාගාර ක්‍රියාකරු - කොන්ත්‍රාත් පදනම මත

**(අලිමංකඩ ලුණු ලේවාය - තනතුරු 01යි)**

**රැකියා සාරාංශය :**

යන්ත්‍රාගාර යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අධීක්ෂණය හා නඩත්තු කිරීමෙහිලා යන්ත්‍රාගාර ක්‍රියාකරුට සහායවීම මගින් හා නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීම සහතිකකරලමින් ෆ්‍රී ෆ්ලෝ ලුණු කුඩු කිරීමේ යාන්ත්‍රාගාර මෙහෙයුම්වලට සහාය වීම සඳහා සහකාර යන්ත්‍රාගාර ක්‍රියාකරු වග වනු ඇත.

**අවශ්‍ය සුදුසකම් :**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් කාර්මික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ අදාළ ක්ෂේත්‍රයක යාන්ත්‍රික/ මෝටර් රථ පිළිබඳ ජාතික වෘතිය සුදුසුකම් හතර (04) මට්ටමට නොඅඩු තනතුරෙහි කාර්යන්ට අදාළ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වැටුප් හා දීමනා**

මූලික වැටුප (රු. 26,290/-) සහ රජයේ අනුමත වෙනත් දීමනා (ජීවන වියදම් දීමනාව රු. 17,800/-, මාසික දීමනාව රු. 5,000/-)

**වයස් සීමාව**

වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යටුතුය.

**තෝරාගන්නා ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වෙනත් :**

01. සියලුම තනතුරු සේවකයාගේ කාර්ය සාධනය සහ සමාගම් අවශ්‍යතාවය මත දීර්ඝ කිරීමට අදාළ වේ.
02. සෑම අයදුම්කරුවකුම
    i. ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.
    ii. තනතුරෙහි රාජකාරි මනාව ඉටුකිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාව සහිත විය යුතුය.
    iii. විශිෂ්ඨ චරිතයකින් හෙබි විය යුතුය.

**ඔබේ ජීව දත්ත සහිත අයදුම්පත්, සහතික පිටපත් සමග 2024.07.22 දින හෝ ඊට පෙර පහත ලිපිනයට යොමු කළ යුතුය.**


**සාමාන්‍යාධිකාරී,**
**ජාතික ලුණු සමාගම**
**නො. 561/3, ඇල්විටිගල මාවත, කොළඹ -05**
**011-2367974**


ලිපිනයේ වම් ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කළ යුතුය. කෙටිලැයිස්තු ගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ඇත.